විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
# PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරියඇිල.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரியNo.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/EXM04/MSO/EB- III | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.12. 02 |

ප්‍රධාන ලේකම්, (බ.ප.)
ආණ්ඩුකාර ලේකම්, (බ.ප.)
සභා ලේකම්, (බ.ප.)
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, (බ.ප.)

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවට නියමිත පුහුණු පාඨමාලාව - 2025**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණිය සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවෙන් නියමිත පුහුණු පාඨමාලාව - 2025 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. එම අයදුම්කරුවන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මඟින් මාර්ගගත ක්‍රමය මඟින් (Online) **2024.12.16** දිනට පෙර අයදුම් කල යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් **2024.12.23** දිනට පෙර ආයතන ප්‍රධානියා මඟින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය. මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මේ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරුවන් නොමැත්තේ නම් ඒ බවද දන්වා එවන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

Tel – 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවට නියමිත පුහුණු පාඨමාලාව - 2025

- **සැලකිය යුතුයි - සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) යටතේ පමණක් අයදුම්කළ යුතුය.**

01. උක්ත පාඨමාලාව යථා කාලයේදී බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් පවත්වනු ලබන අතර එම දිනය පිළිබඳ තොරතුරු අයදුම්කරුවන්හට පසුව දන්වා එවනු ලැබේ.

02. <u>යෝග්‍යතාව</u>

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ **කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීහු** පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීම සඳහා සුදුස්සෝ වෙති.

03. විභාගයට පෙනී සිටීම සඳහා සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් අයදුම්කළ යුතුය. එසේ අයදුම් කිරීමෙන් පසු යොමු අංකය සහිත මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියා මගින් ධුරාවලිය ඔස්සේ අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනට පෙර එවීමට කටයුතු කළ යුතුය.

(අ) **2024.12.16** දින හෝ ඊට පෙර මාර්ගගත (Online) ක්‍රමය යටතේ අයදුම් කරන ලද මුද්‍රිත අයදුම්පත්‍ර **2024.12.23** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල රාජගිරිය"** යන ලිපිනයට තම දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් (බ.ප), මගින් එවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

**සටහන : අයදුම්පත්‍ර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ හෝ මෙම කාර්යාලයේ වෙනත් නිළධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.**

(ආ) මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් ඉල්ලුම්පත්‍රයක් තැපැලෙන් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

04. <u>පාඨමාලාවේ විෂය නිර්දේශය</u>

| **මොඩියුලය** | **කාලය** |
|---|---|
| රාජ්‍ය සේවයේ විනය ක්‍රියාපටිපාටිය | දින 02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 |
| සංවිධාන ඵලදායීත්වය | දින 02 |
| ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය | දින 02 |
| තොරතුරු දැන ගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 |

**05.** බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර ඉහත අංක 04හි සඳහන් මොඩියුල පහම සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් පමණක් බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

**06 .** තවද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇමුණුම අංක 06 යටතේ සඳහන් විභාගය සමත් වීම හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 02 යටතේ අංක 06 කොටස මඟින් දක්වා ඇති පාඨමාලාවේ විෂය නිර්දේශය යටතේ ඇති මොඩියුල 05ම සාර්ථකව සම්පූර්ණ කිරීම හැර විභාගයේ විෂයයන් හා පාඨමාලාවේ විෂයයන් ඒකාබද්ධ වූ විෂයෙන් විෂයට නිදහස් කිරීමේ පදනමක් මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමක් කිසිසේත් සිදු කරනු නොලැබේ.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2024.12. 02

Tel - 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk